උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ - පළාත් සංරචකය - 2013

---

උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ - පළාත් සංරචකය 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජය (ශ්‍රීලංර) සහ ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2010 අගෝස්තු 27 දින එළඹි අංක 2640-එස්ආර්අයි(එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ක්‍රියාත්මක කිරීම,අරමුණු,අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, උතුරු පළාතේ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන අතර, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, උතුරු පළාත තුළ හා උතුරු පළාත සහ ශ්‍රී ලංකාවේ දකුණු ප්‍රදේශය අතර සම්බන්ධතාවයන් වැඩිදියුණු කිරීමයි. ව්‍යාපෘතියේ කටයුතු සමන්විත වනුයේ,

**ආ කොටස - ප්‍රතිසංස්කරණය හා ප්‍රතිස්ථාපනය**

වවුනියා හා මන්නාරම දිස්ත්‍රික්කවල පළාත් මාර්ග කිලෝ මීටර් 140 ක් පමණ පුනරුත්ථාපනය කිරීම සහ උතුරු පළාතේ තෝරා ගත් පාළම් පුනරුත්ථාපනය සහ / හෝ ප්‍රතිස්ථාපනය කිරීම.

**ඇ කොටස - උතුරු පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලය ප්‍රතිසංස්කරණය කිරීම.**

ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 27.16 ක් වන අතර, ඉන් එජඩො මිලියන 24.4 (විගැහි (SDR) මිලියන 16.08) ක් මූල්‍යයනය කිරීමට ණය සපයන නියෝජිතායතනය එකඟ වී තිබුණු අතර ව්‍යාපෘතියේ බදු හා තීරු ගාස්තු සඳහා එජඩො මිලියන 2.76 ක මුදලක් ශ්‍රී ලංකා රජය විසින් සපයනු ඇත. 2010 ඔක්තෝබර් 22 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කර තිබුණු අතර, 2015 ජුනි 30 දින වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදී හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය හා ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව, මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සළකණු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ). අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව,

(ආ). ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

(ඇ). ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුනේ ද යන බව,

(ඈ). ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව,

(ඉ). ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව,

(ඊ). පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව,

(උ). අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌණ පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේ ද යන බව, සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේ ද යන බව,

(ඌ). මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(එ). ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව,

**3. මතය**

**-------**

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ). 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ). සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ). අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ). ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ). මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ගයක් ගෙන තිබූ බව සහ,

(ඊ). ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**4. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**4.1 මූල්‍ය කාර්ය සාධනය**

**---------------------**

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු. 449,854,274 ක් වන අතර, 2013 දෙසැම්බර් 31 දිනට

සමුච්චිත වියදම රු. 1,926,118,090 කි. සමාලෝචිත වර්ෂය සඳහා වියදම පෙර වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වියදම් විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 413,838,409 | 756,041,451 | 1,850,134,651 |
| ස්ථාවර වත්කම් | 765,982 | 143,500 | 4,162,353 |
| ණය පොළිය | 15,797,069 | 9,912,013 | 28,741,297 |
| ව්‍යාපෘති කළමනාකරණ වියදම් | 19,452,814 | 14,833,351 | 48,079,789 |
| | 449,854,274 | 780,930,315 | 1,931,118,090 |

## 4.2 අග්‍රිම අරමුදල් ගිණුම

මූලා ප්‍රකාශන සහ ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා අග්‍රිම අරමුදල් ගිණුමෙහි මෙහෙයුම් සහ 2013 දෙසැම්බර් 31 දිනට එම ගිණුමෙහි පවතින ශේෂය පහත දැක්වේ.

| | එ.ජ.ඩො. | රු. |
|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 17,654.06 | 2,244,905 |
| <u>එකතු කළා</u> | | |
| ඌන පූර්ණයන් | 2,796,446.31 | 359,017,772 |
| විදේශ විනිමය වාසිය | - | 2,088,648 |
| | 2,814,100.37 | 363,351,325 |
| <u>අඩු කළා</u> | | |

| | | |
|---|---|---|
| ආපසු ගැනීම් | 2,477,424.08 | 319,329,889 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 336,676.29 | 44,021,436 |

## 5. විගණන නිරීක්ෂණ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

### 5.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූලායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2013 දෙසැම්බර් 31 දිනට තථ්‍ය අරමුදල් උපයෝජනයට අදාල, වැදගත් සංඛ්‍යාලේඛන කීපයක් පහත දැක්වේ.

| | ඇස්තමේන්තුගත මුළු ව්‍යාපෘති පිරිවැය | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | 2013 වර්ෂය තුල අරමුදල් උපයෝජනය | 2013 දෙසැම්බර් 31 දින දක්වා සමුච්චිත අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|---|
| | එජඩො මිලි. | රු. මිලි. | රු. මිලි. | රු. මිලි. | එජඩො මිලි. | රු. මිලි. |
| ආසබැ | 24.40 | 3,172.0 | 449.5 | 405.0 | 13.26 | 1,724 |
| ශ්‍රිලංර | 2.76 | 358.8 | 57.6 | 44.9 | 1.55 | 202 |
| එකතුව | 27.16 | 3,530.8 | 507.1 | 449.9 | 14.81 | 1,926 |

### 5.2 භෞතික කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). රු. මිලියන 2,509 ක පිරිවැයකින් දුර කිලෝමීටර් 140 ක් වූ උතුරු පළාතේ පළාත් මාර්ග 6 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා ව්‍යාපෘතිය කොන්ත්‍රාත් 6 ක් 2011 පෙබරවාරි ප්‍රදානය කර තිබුණි. එක් එක් කොන්ත්‍රාත්තුවේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය පහත දැක්වේ.

| මාර්ගය | දුර කිලෝ මීටර් | කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තුගත පිරිවැය (VAT සහිත) | 2013 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්තුවේ තථ්‍ය පිරිවැය (VAT සහිත) | නිම කිරීමට නියමිත දිනය | සත්‍ය වශයෙන් නිම කළ දිනය | 2013 දෙසැම්බර් 31 දිනට කාර්ය නිම කිරීම ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|
| ------- | ------- | --------------- | ---------------- | ------------- | ------------- | ------------- |
| | | රු. | රු. | | | |
| එන්පී01 | 15.49 | 457,925,394 | 428,101,852 | 12.04.2013 | 12.04.2013 | 100 |
| එන්පී02 | 26.50 | 517,584,090 | 367,305,995 | 30.10.2013 | - | 66 |
| එන්පී03 | 17.32 | 378,316,673 | 335,637,874 | 18.11.2012 | 18.11.2012 | 100 |
| එන්පී04 | 26.00 | 351,923,141 | 256,107,270 | 23.05.2013 | 23.06.2013 | 100 |
| එන්පී05 | 28.80 | 448,435,022 | 290,003,389 | 23.05.2013 | 23.05.2013 | 100 |
| එන්පී06 | 27.20 | 355,416,235 | 172,978,271 | 23.05.2013 | 31.05.2013 | 65 |

(ආ). ඉහත පුනරුත්ථාපන කාර්යයන්වල භෞතික කාර්ය සාධනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i). වෙප්පන්කුලම් - පෙරියමුරිප්පු (එන්පී02) මාර්ගය පුනරුත්ථාපන කිරීමේ කොන්ත්‍රාත් කාලය 2013 පෙබරවාරි සම්පූර්ණ වීමට මුලිකව අපේක්ෂා කළද 2014 අප්‍රේල් දක්වා දීර්ඝ කර තිබුණි. ලබා ගත හැකි වූ තොරතුරු අනුව 2013 දෙසැම්බර් 31 දිනට පුනරුත්ථාපන කාර්යයන්ගෙන් සියයට 66 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. එම නිසා කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන් කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. කොන්ත්‍රාත්තුව නැවත ප්‍රදානය කිරීම සඳහා 2014 ජූනි 30 වන විටද ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ii). පුතූර් - පලාමඩු (එන්පී06) මාර්ගයේ පුනරුත්ථාපන කටයුතු ද සමාලෝචිත වර්ෂය අවසානයට සියයට 65 ක මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කෙරේ.

(iii). සිදුකළ යුතු කාර්යයන් වල ස්වභාවය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා සුදුසු භූමි සමීක්ෂණ සිදුකර නොමැති බව කොන්ත්‍රාත් කීපයකම කාණු පද්ධතිය හා ව්‍යුහයන් වල විෂය පථය නිතරම වෙනස් කිරීම මඟින් පෙන්නුම් කෙරේ. ඉරට්ටපෙරියකුලම් - පුතූර්, වෙඩ්ඩිකුලම් - තුඩරිකුලම් සහ පන්ඩිවුරිච්චාන් - ආන්ඩියපුලියන්කුලම් (එන්පී04) මාර්ගවල මුලික ප්‍රමාණ පත්‍රවල රු. මිලියන 4.48 කට අගය කර තිබූ කාණු පද්ධති හා ව්‍යුහමය කාර්යයන් රු. මිලියන 13.77 කට සංශෝධනය කර තිබූ අතර මහියන්කුලම් -

පල්ලමඩු මාර්ගයේ (එන්පී05) මුලිකව රු. මිලියන 6.2 කට අගය කර තිබූ කාණු පද්ධති හා ව්‍යුහමය කාර්යයන් රු. මිලියන 24.49 ක් ලෙස සංශෝධනය කර තිබුණි.

**5.3 කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම**

**-------------------------------------**

ව්‍යාපෘතියේ "ඇ" කොටසේ " උතුරු පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යාලය පුනරුත්ථාපනය කිරීම" නමින් රු. මිලියන 70 ක වියදමින් කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ඇතුලත් වුවද, 2014 ජූනි 30 වන විටද කොන්ත්‍රාත්තුව පිරිනමා නොතිබුණි.